පළාත් මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය

# මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

# පුරප්පාඩු

**මාර්ග ඉදිකිරීම් සඳහා වන මධ්‍යම පළාතේ ප්‍රමුඛතම ආයතනය සමග එක්වන්න අවස්ථාවක්**

**මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ පහත දැක්වෙන තනතුරු සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.**

## බර යන්ත්‍ර ක්‍රියාකරු - තනතුරු 14

- **බඳවා ගන්නා ශ්‍රේණිය - III ශ්‍රේණිය**
- **වැටුප් පරිමාණය**

  කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව.

  PL 3-2025 රු.43,280-10X490-10X540-10X590-12X630-67,040/-

- **මූලික වැටුප**

  රු. 43,280/- ක මූලික වැටුප හිමි වනු ලබන්නේ 2027.01.01 දින සිටය. බඳවා ගැනීමේ මූලික වැටුප් පියවර කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 දරන චක්‍රලේඛයේ උපලේඛන අංක II හි සඳහන් පරිදි රු. 40,834/- කි. නොගෙවන වැටුප රු. 2,447/- කි.

- **සුදුසුකම්**

  **බාහිර අයදුම්කරුවන්**

  **ප්‍රවීණතා :**

  මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබාතිබීම සමග බර යන්ත්‍ර හැසිරවීම සම්බන්ධයෙන් ඉදිකිරීම් ඉංජිනේරු ආයතනය විසින් ලබාදෙනු ලබන (NVQ) හතරවෙනි (04) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ බර යන්ත්‍ර ක්‍රියා කරවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුනක (03) ක පළපුරුද්දක් ලබා තිබීම.

  **අභ්‍යන්තර අයදුම්කරුවන්**

  ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

- **වයස**

  අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## විදුලි කාර්මික - තනතුරු 01

- **බඳවා ගන්නා ශ්‍රේණිය - III ශ්‍රේණිය**
- **වැටුප් පරිමාණය**

  කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව.

  PL 3-2025: රු.43,280-10X490 - 10X540 - 10X590 - 12X630 - 67,040/-

- **මූලික වැටුප**

  රු. 43,280/- ක මූලික වැටුප හිමි වනු ලබන්නේ 2027.01.01 දින සිටය. බඳවා ගැනීමේ මූලික වැටුප් පියවර කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 දරන චක්‍රලේඛයේ උපලේඛන අංක II හි සඳහන් පරිදි රු. 40,834/- කි. නොගෙවන වැටුප රු. 2,447/- කි.

- **සුදුසුකම්**

  **බාහිර අයදුම්කරුවන්**

  **ශිල්පීය නිපුණතා :**

  විදුලි කාර්මික ශිල්පය සම්බන්ධයෙන් තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්තා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතර (04) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

  වාහන විදුලි කාර්මික ශිල්පය සම්බන්ධයෙන් (Automobile Electrican) ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතරවෙනි (04) මට්ටම් සපුරා තිබීම් ප්‍රමුඛ සුදුසුකමක් ලෙස සැලකේ.

  **අභ්‍යන්තර අයදුම්කරුවන්**

  විදුලි කාර්මික ක්ෂේත්‍රයෙහි වසර පහ (05) ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින් / වෘත්තීය පුහුණු ආයතනයකින් විදුලි කාර්මික ශිල්පය සම්බන්ධයෙන් ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවැනි(02) මට්ටමට නොඅඩු මට්ටමක වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත් වන ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL 2) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක සේවකයින්

  **හෝ**

  විදුලි කාර්මික ශිල්පය සම්බන්ධයෙන් තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්තා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හතර (04) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

  වාහන විදුලි කාර්මික ශිල්පය සම්බන්ධයෙන් (Automobile Electrican) ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතර (04) වෙනි මට්ටම සපුරා තිබීම ප්‍රමුඛ සුදුසුකමක් ලෙස සැලකේ.

- **වයස :**

  අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## පැස්සුම්කරු - තනතුරු 02

- **බඳවා ගන්නා ශ්‍රේණිය - III ශ්‍රේණිය**
- **වැටුප් පරිමාණය**

  කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව.

  PL 2-2025-රු.42,300- 10X490 - 10X540 - 10X590-12X630 - 66,060/-

- **මූලික වැටුප**

  රු. 42,300/- ක මූලික වැටුප හිමි වනු ලබන්නේ 2027.01.01 දින සිටය. බඳවා ගැනීමේ මූලික වැටුප් පියවර කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 දරන චක්‍රලේඛයේ උපලේඛන අංක II හි සඳහන් පරිදි රු. 40,008/- කි. නොගෙවන වැටුප රු. 2,293/- කි.

- **සුදුසුකම්**

  **බාහිර අයදුම්කරුවන්**

  පැස්සුම්කරණ ශිල්පය සම්බන්ධයෙන් තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්තා ලද කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (NVQ) දෙවැනි (02) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

  **අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

  1. පැස්සුම්කරණ ක්ෂේත්‍රයෙහි වසර (05) ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින් / වෘත්තීය පුහුණු ආයතනයකින් පැස්සුම්කරු තනතුරෙහි කාර්ය භාරයට අනුකූල වන වෘත්තීය පරීක්ෂණයක (Trade Test) දී තහවුරු කෙරෙන ජාතික වෘත්තීය කුසලතාව (NVQ) දෙවැනි(02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතාවය සහිත ප්‍රාථමික ශිල්පීය නොවන (PL I) සේවා ගණයක සේවකයින්
  2. පැස්සුම්කරණ ශිල්පය සම්බන්ධයෙන් තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත්තා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (NVQ) දෙවැනි (02) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

- **වයස :**

  අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## ඉංජෙක්ටර් පොම්ප ක්‍රියාකරු - තනතුරු 01

- **බඳවා ගන්නා ශ්‍රේණිය - III ශ්‍රේණිය**
- **වැටුප් පරිමාණය**

  කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව.

  PL 2-2025: රු.42,300- 10X490 - 10X540 - 10X590-12X630-66,060/-

- **මූලික වැටුප**

  රු. 42,300/- ක මූලික වැටුප හිමි වනු ලබන්නේ 2027.01.01 දින සිටය. බඳවා ගැනීමේ මූලික වැටුප් පියවර කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 දරන චක්‍රලේඛයේ උපලේඛන අංක II හි සඳහන් පරිදි රු. 40,008/- කි. නොගෙවන වැටුප රු. 2,293/- කි.

- **සුදුසුකම්**

  **බාහිර අයදුම්කරුවන්**

  ඉංජෙක්ටර් පොම්ප ක්‍රියාකරවීම සම්බන්ධයෙන් තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්තා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (NVQ) දෙවැනි (02) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

  **අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

  1. ඉංජෙක්ටර් පොම්ප ක්‍රියාකරවීම සම්බන්ධයෙන් වසර පහ (05) ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින්/ වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්යභාරයට අනුකූල වන වෘත්තීය පරීක්ෂණයක දී (Trade Test) දී තහවුරු කෙරෙන ජාතික වෘත්තීය කුසලතාව (NVQ) දෙවැනි (02) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතාවය සහිත ප්‍රාථමික ශිල්පීය නොවන (PL I) සේවා ගණයක සේවකයින්
  2. ඉංජෙක්ටර් පොම්ප ක්‍රියා කරවීම සම්බන්ධයෙන් තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්තා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (NVQ) දෙවැනි (02) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

- **වයස**

  අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### පොදු කොන්දේසි

1. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
3. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
4. සෑම අයදුම්කරුවෙකුම තනතුරට බඳවා ගැනීම සඳහා අදාළ වන සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.
5. අධිකාරියේ ස්ථිර පත්වීම් ලද අය පමණක් අභ්‍යන්තර අයදුම්කරුවන් ලෙස සලකනු ලැබේ.
6. රජයේ හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය කරනු ලබන්නේ නම් ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත ඉදිරිපත් කළ යුතුයි.
7. අයදුම්කරුවන් විසින් තමාගේ ජීව දත්ත අඩංගු අයදුම්පත සකස්කර එවිය යුතු අතර, තමා පිළිබඳ තොරතුරු ලබාගත හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සඳහන් කර එවිය යුතුය.
8. ඔබ විසින් යොමු කරනු ලබන අයදුම් පත්‍රයේ සඳහන්ව ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුව හොත් නුසුදුස්සෙකු සේ සලකා ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමේන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.
9. අදාළ ක්ෂේත්‍රයේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය තුළ සේවා පළපුරුද්ද සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.

### බඳවා ගන්නා ක්‍රමය

- බර යන්ත්‍ර ක්‍රියාකරු, විදුලි කාර්මික, පැස්සුම්කරු සහ ඉංජෙක්ටර් පොම්ප ක්‍රියාකරු තනතුරු සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හා වෘත්තීය ප්‍රායෝගික පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ.

මෙම දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා පත් කිරීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් විසින් ජීව දත්ත විස්තර ඇතුළත් කර සකස් කරන ලද අයදුම්පත් අදාළ සහතිකවල පිටපත්ද (සහතික කරන ලද) සමග බහා එවනු ලබන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුරු නාමය සඳහන් කර 2026.06.12 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතුය.

අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් හා ලිපි කවරයේ තනතුර සඳහන් නොකර යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සාමාන්‍යාධිකාරී,**
**පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය,**
**මධ්‍යම පළාත.**

**පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය,**
**අංක 09, ඇහැලේපොළ කුමාරිහාමි මාවත,**
**බෝගම්බර, මහනුවර.**
**දුරකථන අංකය 081-2204378**